# මුරගලෙහි කලාත්මක සංවර්ධනය පිළිබඳ විමසුමක්

ආර්.එච් දර්ශනී සංචලා*

විහාරයකට පිවිසෙන දොරටුව දෙපස කොරවක්ගලෙහි ආරක්ෂාව සඳහා මුල් කාලයේ හතරැස් ගල් පතුරු දෙකක් ලෙස තබන ලද මුරගල පසු කාලයේ ඉතා අලංකාර කැටයම් සහිත කලා නිර්මාණයන් ලෙස පරිවර්තනය විය. මූලික වශයෙන් මුරගල, කොරවක්ගල ඉදිරියට ලිස්සායාම වැළැක්වීම සඳහා තබන ලද ආරක්ෂක ගලක් ලෙස හැඳින්වේ. අරක්ගල, ආරක්ෂකගල, කුඤ්ඤගල යන විවිධ නාමයන් ගෙන් මෙම මුරගල හඳුන්වා ඇත. මුරගල ආරක්ෂාව සඳහා පමණක් නොව ගොඩනැගිල්ල ට ගරු ගාම්භීරත්වයක් අලංකාරයක් ගෙන ඒම සඳහා ද යොදන ලදී. මුරගලෙහි වර්ධනය පියවර හයකින් සිදුවූ බව කැටයම් පරීක්ෂාවේ දී අනාවරණය වේ. ප්‍රථමයෙන් ම මුරගල දිග හතරැස් ගල් පුවරුවකි. දෙවනුව මුරගලෙහි මුදුනේ මැද උන්නතිය සහිත ගැටිත්තක් සහිතව නිර්මාණය කර ඇත. පුන්කලස කැටයම් කළ මුරගල තෙවැනි අවස්ථාවයි. සිව්වෙනුව ශංඛ සහ පද්ම හා වාමන රූප මුරගලට යොදාගෙන ඇත. පස් වනුව මුරගලට දිසාපාලක රූපය එක්වන අතර සයවනුව දිසාපාලක මුරගලට පසුව මකර තොරණ එක් වී ඇත. මුරගල ආරම්භයේ දී එය කිසිදු කැටයමකින් තොර වූවකි. එමෙන්ම මෙම ප්‍රථම අවස්ථාවේ දී සඳකඩපහණ, පාටිකා, කොරවක් ගල් ද කැටයමින් තොරවිය. මුරගලෙහි දෙවෙනි සංවර්ධන අවස්ථාව වනවිට එහි මුදුනෙහි ගැටිත්තක් නිර්මාණය කොට ඇත. එය මුරගල කලාත්මක ව විකාශය වීමේ ආරම්භය ලෙස මූර්තිමත් වේ. පුන්කලස, මුරගල ට එක්වූ පළමු කැටයම වන අතර එමගින් සෞභාග්‍යය සහ සශ්‍රිකත්වය මූර්තිමත් වන බව විචාරක මතය වේ. මුරගල තව දුරටත් කලාත්මක ව සංවර්ධනය වීමේදී ඉන්දියානු ආභාසය සහිතව ශංඛ හා පද්ම බහිරවයන් දෙදෙනෙකු කැටයම් විය. මේඝ දූතයේ සඳහන් වන කුවේරයාගේ නිධි රකින ශංඛ පද්ම බහිරවයන් මෙහිදී කැටයමට නැගුණු බව විචාරක මතයයි. සතර වරම් දෙවියන් මුරගලෙහි කැටයම් වූයේ ඉන් පසු අවස්ථාවේ දීය. සතර වරම් දෙවියන් ඉන්පසු අවස්ථාවන් හි එක් එක් දිසාවන් රකින දිසා පාලකයන් ලෙස මුරගලෙහි කැටයම් කෙරිණ. දිසා පාලකයන් සමග ඒ ඒ දිසාපාලක තුමන්ට අදාළ සත්වයෙකු කැටයම් කළ අතර ,දිසාපාලක භාර්යා රූපය ද මුරගලෙහි කැටයම් කර ඇත. මකර තොරණ කැටයම, මුරගලෙහි රමණීයත ම අවස්ථාව පෙන්වනු ලබයි. වර්ග කිහිපයක මුරගල් දක්නට ඇති අතර ලියවැල සහිත මුරගල ප්‍රසිද්ධ ය. මෙම පර්යේෂණය තුළින් මුරගල කලාත්මක ව සංවර්ධනය වූයේ කෙසේ ද යන්න සාකච්ඡා කරන අතර එය සාහිත්‍යය මූලාශ්‍රය ඇසුරෙන් සිදුකිරීම ට අපේක්ෂිත ය. කිසිදු කැටයමකින් තොර වූ මුරගල කලාත්මකව හා අර්ථ සහිතව සංවර්ධනය වූ අවස්ථාවන් මෙම අධ්‍යයනය මගින් පැහැදිලි කොට ගත හැකි වේ.

ප්‍රමුඛපද - මුරගල, කලාත්මක ,කැටයම්, නිර්මාණ

* පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය darshanisanchala@gmail.com